IHRA
UNIVERSITY OF COLOMBO

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2017/2018

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ **2020** ජූලි)

# BLE 205 - කම්කරු නීතිය

අයදුම්කරුවන්ට උපදෙස් :

**(1)** ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සැපයිය යුතුය.

**(2)** පිළිතුරු සඳහා උචිත අයුරු අදාළ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීන්දු ඇතුළත් කළ යුතුය.

(3) අපහැදිලි අත්අකුරු සඳහා ලකුණු අඩු කෙරේ.

(4) කාලය පැය තුනයි. (03)

(5) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(6) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(7) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

01. දෙපාර්ශවයක් අතර සේව්‍ය-සේවක සම්බන්ධතාවයක් පවතීද යන්න විනිශ්චය කි
පාලනය පිළිබඳ පරීක්ෂණය (Control Test) වර්තමානයේ පවතින කාර්මික සබඳත
සංකීර්ණතාවය මත යල්පැන ගිය එකක් බවට පත්ව ඇත.
සේව්‍ය-සේවක සම්බන්ධතාවය විනිශ්චය කරන්නා වූ පරීක්ෂණ කෙරෙහි අවධානය
කරමින් උක්ත ප්‍රකාශය විවේචනාත්මකව විමර්ශනය කරන්න.

(ලකුණු

02. සමන්, ද පීපල්ස් පවර් පෞද්ගලික සමාගමේ කළමනාකරණ සහයකයෙකු ලෙස සේවය
බැඳුණු අතර ඔහුගේ සේවා ගිවිසුමේ පහත වගන්තීන් ඇතුළත් කර තිබුණි.

i. ඔබගේ පත්වීම මාස 06 ක පරිවාස කාලයකට යටත් අතර, ආයතනය ඔබව ස්ථිර සේවකයෙකු ලෙස පත් කරන්නේ නම් මිස, ඔබ තවදුරටත් පරිවාසකයෙකු ලෙසම සේවයේ යෙදවීමට ආයතනයට හැකියාව ඇත.

ii. ඔබගේ පරිවාස කාලය තුළ ඕනෑම අවස්ථාවක කිසිදු හේතු දැක්වීමකින් තොරව ඔබගේ සේවය අවසන් කිරීමට ආයතනය සතුව හැකියාව ඇත.

iii. රැකියාව ස්ථිර කර ගැනීමට ඔබට කිසිදු අයිතියක් නොපවතින අතර, ඒ පිළිබඳ එකම තීරකයා ආයතනය වේ.

සමන් වර්ෂ 2019.10.01 දින සේවයට බැඳෙන ලද අතර, එදිනම ඔහුට අදාල පත්වීම් ලිපිය ඉහත කොන්දේසි ද ඇතුළත් කරමින් ලබා දෙන ලදි. පළමු මස තුළම ඔහු ආයතනයේ හොඳම සේවකයා යන සම්මානය ලබා ගන්නා අතර, නිසැක ලෙසම ඔහුගේ සේවය ස්ථිර කරන බවට වාචික පොරොන්දුවක්ද ආයතනය විසින් ලබා දෙන ලදි. මේ අතරතුර සමන් ආයතනයේ ප්‍රධානියාගේ දියණිය සමඟ ප්‍රේම සම්බන්ධයක් ඇති කරගන්නා අතර, ඒ සම්බන්ධයෙන් අප්‍රසාදයට පත්වන ආයතන ප්‍රධානියා හේතු නොදක්වාම සමන් සේවයෙන් ඉවත් කරනු ලබයි.

ඉහත සිදුවීමට අදාල ක්‍රියාවන්හි නෛතිකත්වය විමසන්න. ඔබේ පිළිතුර විනිශ්චිත නඩු තීන්දු මඟින් තහවුරු කළ යුතුය.

(ලකුණු 20)

03. විනයානුකූල නොවන කරුණකදී වුවද පෞද්ගලික අංශයේ සේවා යෝජකයෙකුට, සේවකයෙකු ඉවත් කිරීමට හැකියාව ඇති අතර එහිදී සුවිශේෂී කරුණු කිහිපයක් කෙරෙහි අවධානය යොමු කොට නිවැරදි ආකාරයට එය සිදු කළ යුතු වේ.
අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන හා නඩු තීන්දු දෙස අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

(ලකුණු 20)

**04.** සේවකයෙකු සේවයෙන් ඉවත් කිරීම සඳහා සේවායෝජකයෙකු විසින් අදාල කර ගත හැකි විවිධ විනයානුකූල කරුණු හඳුනාගත හැකිය. එවැනි කරුණු 04ක් පැහැදිලි කරන්න.
ඔබගේ පිළිතුර සනාථ කිරීමට අදාල විනිශ්චිත නඩු තීන්දු සහ අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සඳහන් කිරීම අවශ්‍ය වේ.

**(ලකුණු 20)**

**05.** 1950 අංක 43 දරන, කාර්මික ආරවුල් පනත සංශෝධනය කරමින් ස්ථාපිත කළ කාර්මික පර්ශද සඳහා "සාධාරණ සහ යුක්ති සහගත (Just & Equitable) තීන්දු" ලබා දීමේ වගකීමක් පවතී.
කාර්මික පර්ශද ස්ථාපිත කිරීමට බලපෑ ඓතිහාසික කරුණුද ගෙන හැර දක්වමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විමසන්න. විනිශ්චිත නඩු තීන්දු මඟින් ඔබගේ පිළිතුර සනාථ කළ යුතු වේ.

**(ලකුණු 20)**

**06.** කම්කරු නීතිය (Labour Law) සංවර්ධනයෙහි ලා ලෝක කම්කරු සංවිධානයේ (International Labour Organization – (ILO)) කාර්යය විමසන්න.

**(ලකුණු 20)**

**07.** ශ්‍රී ලංකාවේ පවතින නෛතික රාමුව තුළ කාන්තා හා ළමා ශ්‍රමය අවභාවිතා වීම වැළැක්වීම හා විධිමත් කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග අදාල ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන සමඟ විස්තර කරන්න. ඒවායේ උපයෝගීතාවය විමර්ශනය කරන්න.

**(ලකුණු 20)**

**08.** පහත සඳහන් ඕනෑම මාතෘකා <u>දෙකක්</u> සඳහා කෙටි සටහන් ලියන්න.

(එකකට ලකුණු **10 x 2 = 20)**

i. ආර්ථික යථාර්ථය පිළිබඳ පරීක්ෂණය (Economic Reality Test)
ii. අනියම් සේවක ගිවිසුම්
iii. කාර්මික පර්ශදයකට අයදුමක් ඉදිරිපත් කිරීමේදී අනුගමනය කළ යුතු ක්‍රියා පිළිවෙත
iv. වැඩ වර්ජනයේ අයිතිය

**************************************

IHRA
UNIVERSITY OF COLOMBO

189

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2017/2018

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජූලි)

## BLE 206 - ශ්‍රී ලංකාවේ ශ්‍රම භාවිතයේ ඓතිහාසික පැතිමාන

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) සහ පිටු දෙකකින් (02) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

05.

01.

i. ශ්‍රී ලංකාවේ ජලාශ්‍රිත ශිෂ්ටාචාරයේ ජනාවාස බිහිවීම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. ජලාශ්‍රිත ශිෂ්ටාචාරය බිඳවැටීම කෙරෙහි බලපෑ සාධක සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

02.

i. කිසියම් සමාජයක ආගම ආරම්භ වීම සහ පැවතීම කෙරෙහි බලපානු ලබන සාධක ගෙනහැර දක්වන්න.

(ලකුණු 10)

ii. වර්ථමාන සමාජය තුළ ආගමේ කාර්යභාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

03.

i. වර්ථමාන කාන්තාවගේ සමාජ තත්වය කෙරෙහි බලපාන සාධක උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ii. වර්ථමාන කාන්තාව රැකියාවෙහි නියැළීම, පවුල කෙරෙහි කරනු ලබන බලපෑම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

04.

i. සමාජ ව්‍යුහය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ii. තත්ත්වය සහ කාර්යයභාරය යනු කුමක්දැයි පැහැදිලි කර තත්ත්ව, තතත්ව අතර සහ කාර්යභාර, කාර්යභාර අතර ගැටුම් යන්නෙන් අදහස් කරන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

05.

i. 'පවුල' යන සංකල්පය නිර්වචනය කරන්න.

(ලකුණු 08)

ii. පවුල මඟින් ඉටුකරනු ලබන විශ්වීය කාර්යභාර සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

06.

i. සංස්කෘතිය යනු කුමක්දැයි නිර්වචනය කර, සංස්කෘතිය තුළ පවතින ප්‍රධානම මූලිකාංග සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ii. සංස්කෘතීන් තුළ පවතින සමාන අසමාන කම් උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

07. වතු වැවිලි ආර්ථික ක්‍රමය ලංකාවට හඳුන්වාදීම මඟින් සිදුවූ සමාජ, ආර්ථික ප්‍රතිඵල සාකච්ඡා කරන්න.

(ලකුණු 20)

08. පහත දැක්වෙන මාතෘකා අතරින් හතරක් (04) පිළිබඳව කෙටි සටහන් ලියන්න.

i. වතුවැවිලි ආර්ථික ක්‍රමය
ii. රාජකාරි ක්‍රමය
iii. බිඳුණු පවුල
iv. ශ්‍රී ලංකාවේ වතු කම්කරුවන්
v. කුල ක්‍රමය
vi. සමාජ සංස්ථා

(ලකුණු 4x5 = 20)

*******************************************

UNIVERSITY OF COLOMBO

මානව සම්පත් අභිවර්ධන ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

# ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2017/2018

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජූලි)

# BLE 207 (a) - වාණිජ නීතිය

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් **(08)** සහ පිටු දෙකකින් **(02)** සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

**01.**

i. 1896 භාණ්ඩ විකිණීමේ ආඥා පනත අදාළ වන්නේ කවර වර්ගයේ භාණ්ඩ සම්බන්ධයෙන්ද?

(ලකුණු 10)

ii. භාණ්ඩ විකිණීමේ ගිවිසුමක මිල නොලත් විකුණුම්කරුවකු සතු ප්‍රතිකර්ම මොනවාද?

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**02.**

i. අර්පණයක්, අර්පණයකට ආරාධනා කිරීමකින් වෙනස් වන්නේ කෙසේද?

(ලකුණු 10)

ii. ගිවිසුම් නීතියට අනුව සෑම එකඟතාවයක්ම නීතිය ඉදිරියේ බලාත්මක කළ හැකිද?

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**03.**

i. අවශ්‍යතාවය මත සහ අපරානුමැතිය මත නියෝජ්‍යත්වය ඇතිවීම සඳහා සම්පූර්ණ කළ යුතු කොන්දේසි කවරේද?

(ලකුණු 10)

ii. ස්වාමිපුරුෂයාගේ නියෝජිත ලෙස ගේදොර අවශ්‍යතා වෙනුවෙන් ස්වාමිපුරුෂයාගේ කීර්තිනාමය ඇපයට තබා ණයට භාණ්ඩ ලබා ගැනීමට භාර්යාවකට අසීමිත බලයක් හිමිව තිබේද?

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**04.**

i. හවුල් ව්‍යාපාරයක ණය ගනුදෙනු සම්බන්ධයෙන් හවුල් ව්‍යාපාරයට අලුතින් එක්වන සහ හවුල් ව්‍යාපාරයෙන් ඉවත්ව යන හවුල්කරුවන්ට වගකීමක් තිබේද?

(ලකුණු 10)

ii. හවුල් ව්‍යාපාරයක පැවැත්ම නිශ්චය කර ගැනීම සඳහා අදාළ කරගත හැකි රීති කවරේද?

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

ප්‍රතිග්‍රහණය සන්නිවේදනය වීම අවශ්‍යමද?

(ලකුණු 10)

ii. ගිවිසුමක් අවසානයට පත්විය හැකි ආකාර හඳුනාගෙන ගිවිසුම් කඩ කිරීමක දී ලබාගත හැකි ප්‍රතිකර්ම මොනවාදැයි සාකච්ඡා කරන්න?

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

i. භාණ්ඩ විකිණීමක දී නෙමෝ ඩාට් රීතියේ බලපෑම සීමා වන්නේ කවර අවස්ථාවලදී ද?

(ලකුණු 10)

ii. භාණ්ඩ විකිණීමේ ගිවිසුමක ව්‍යංග නියමයන් මොනවාද?

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**07.**

i. හවුල් ව්‍යාපාරයක හවුල්කරුවන්ගේ යුතුකම් සහ අයිතිවාසිකම් මොනවාද?

(ලකුණු 10)

ii. හවුල් ව්‍යාපාරයක මූලික ප්‍රාග්ධනය රුපියල් දහස (රු. 1000/-) ඉක්මවන විටෙක එම හවුල් ව්‍යාපාරයේ සිටින සියලුම හවුල්කරුවන් විසින් අත්සන තබන ලද ලිඛිත ගිවිසුමක් අනිවාර්යයෙන්ම තිබිය යුතුද?

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

**08.**

i. නියෝජිතයකුගේ යුතුකම් සහ අයිතිවාසිකම් මොනවාද?

(ලකුණු 10)

ii. නියෝජ්‍යත්වය අවසානයට පත් විය හැක්කේ කෙසේද?

(ලකුණු 10)

**(මුළු ලකුණු 20)**

************************************************************

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2017/2018

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජූනි)

## BLE 207 (b) - පිරිවැයකරණය හා විගණනය

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ප්‍රශ්න පහකට **(05)** පමණක් පිළිතුරු සැපයිය යුතුය.

(2) ගණක යන්ත්‍ර භාවිතා කල හැක.

(3) කාලය පැය තුනයි. (03)

(4) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු පහකින් (05) සමන්විත වේ.

(5) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(6) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

**01.**

(අ) පිරිවැයකරණයෙන් සැපයෙන තොරතුරු නිෂ්පාදන ආයතනයක කළමනාකරුවෙකුට කුමන අයුරින් වැදගත් වන්නේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ආ) පිරිවැය ඒකකයක් සහ පිරිවැය මධ්‍යස්ථානයක් අතර වෙනස උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) ඒකකයක ස්ථාවර පිරිවැය විචල්‍ය වන අතර, ඒකකයක විචල්‍ය පිරිවැය ස්ථාවර වේ. ස්ථාවර සහ විචල්‍ය පිරිවැය සංකල්ප පැහැදිලි කරමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

**02.**

(අ) නිෂ්පාදන ආයතනයක තොග පාලනය සඳහා යොදාගත හැකි විවිධ තොග පාලන ශිල්පක්‍රම පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) සුමුදු නිෂ්පාදකයෝ 'A' සහ 'B' නම් වූ භාණ්ඩ වර්ග 2 නිෂ්පාදනය කරන අතර ඊට අදාලව සාරාංශ කරගත් පොදුකාර්යය පිරිවැය දත්ත පහත දැක්වේ.

| නිෂ්පාදනය | සත්‍ය නිෂ්පාදනය ඒකක | මුළු යන්ත්‍ර පැය | මුළු ඇනවුම් ගණන | මුළු යන්ත්‍ර සූදානම් කිරීම් ගණන |
|---|---|---|---|---|
| A | 5,000 | 20,000 | 160 | 20 |
| B | 60,000 | 120,000 | 350 | 45 |

කාල පරිච්ඡේදය තුළ දැරූ සත්‍ය පොදු කාර්යය පිරිවැය පහත දැක්වේ.

| | |
|---|---|
| නිෂ්පාදන පරිමාව හා සම්බන්ධිත පොදු කාර්යය | රු. 550,000/- |
| අමුද්‍රව්‍ය ඇනවුම් හා සම්බන්ධිත පොදුකාර්යය | රු. 12,000/- |
| යන්ත්‍ර සූදානම් කිරීම හා සම්බන්ධිත පොදු කාර්යය | රු. 832,000/- |

ඉහත තොරතුරු ආශ්‍රයෙන් ඒකකයක පොදුකාර්යය පිරිවැය අන්තර්ග්‍රහණ අනුපාතය;

i. ගතානුගතික ක්‍රමය (Traditional Method) පදනම්ව සහ

ii. ක්‍රියාකාරකම් (Activity Based) පදනම්ව ගණනය කරන්න.

(සටහන :- නිෂ්පාදන පරිමා සම්බන්ධිත පොදුකාර්ය යාන්ත්‍රික පැය පදනම මත ගනන් බලන්න.)

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03.

(අ) "ඉහල ශ්‍රම පිරිවැටුම් අනුපාතිකය ආයතනයකට අහිසි බලපෑම් ඇතිකරන්නාක් මෙන්ම, එය ආයතනයකට හිතකර බලපෑම් ද ඇති කරයි". පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) පහත දැක්වෙන පිරිවැය තොරතුරු කාර්යය අංක 210/A/2020 අදාලව සාරාංශ කර ඇත.

i. අමුද්‍රව්‍ය පිරිවැය රු. 7,800/-

ii. ශ්‍රම පිරිවැය :

| | | |
|---|---|---|
| කැපීම් අංශය | පැය 20 | පැයට රු. 40/- බැගින් |
| එකලස් අංශය | පැය 15 | පැයට රු. 35/- බැගින් |
| නිමැවුම් අංශය | පැය 19 | පැයට රු. 50/- බැගින් |

iii. එකිනෙක අංශයේ මුළු පොදු කාර්යය පිරිවැය :

| | |
|---|---|
| කැපීම් අංශය | පැය 1250 සඳහා රු. 15,000/- |
| එකලස් අංශය | පැය 800 සඳහා රු. 12,000/- |
| නිමැවුම් අංශය | පැය 1750 සඳහා රු. 35,000/- |

iv. කාල පරිච්ඡේදයේ ස්ථාවර පොදු කාර්යය පිරිවැය පැය 3800 සඳහා රු. 76,000/-

v. විචල්‍ය පිරිවැය ශ්‍රම පිරිවැය පදනම මතද, ස්ථාවර පොදු කාර්යය පිරිවැය සාමාන්‍ය සෘජුශ්‍රම පිරිවැය පදනම මතද, නිෂ්පාදනයට අන්තර්ග්‍රහණය කරනු ඇත.

vi. පරිපාලන පොදුකාර්යය පිරිවැය ලෙස ප්‍රාථමික පිරිවැයෙන් 10% ක් ද, විකුණුම් හා බෙදාහැරීමේ පොදුකාර්යය ලෙස නිෂ්පාදන පිරිවැයෙන් 5% ක් ද සෑම කාර්යයකටම අන්තර්ග්‍රහණය කරනු ඇත.

vii. මුළු පිරිවැයට 25% එකතු කොට විකුණුම් මිල තීරණය කරනු ඇත.

කාර්යය අංක 210/A/2020 අදාලව කාර්යය පිරිවැය පත්‍රය පිළියෙල කරන්න.

(ලකුණු 10)

(ඇ) වෙළඳපල ඇස්තමේන්තු අනුව වාර්ෂික අවශ්‍යතාව නිමි ඒකක 12,000 කි. එක් නිෂ්පාදන සමූහයක් සඳහා යන්ත්‍ර සූදානම් කිරීමේ පිරිවැය රු. 240/- කි. නිමි ඒකකයක් වර්ෂයක් ගබඩාවේ රඳවා ගැනීමේ පිරිවැය ශත 80 කි. වරකට (සමූහයකට) නිෂ්පාදනය කල යුතු ඒකක ප්‍රමාණය කොපමණද?

(ලකුණු 04)

(මුළු ලකුණු 20)

**04.**

(අ) කිසියම් භාණ්ඩයක් නිෂ්පාදනය කිරීමේදී අමුද්‍රව්‍ය කිලෝවක් රු. 25/- බැගින් කිලෝ 1000 ක් පළමු ක්‍රියාවලියට යොදවා ඇත. මීට අමතරව ක්‍රියාවලියේ සෘජු වැටුප් ලෙස රු. 6000/- ක් ද පොදු කාර්යය පිරිවැය ලෙස රු. 4000/- ක්ද දරා ඇත. ක්‍රියාවලියේ අපේක්ෂිත හානිය ඒකක 100 ක් වන අතර හානිවූ ඒකකයක් රු. 8/- බැගින් සුන්බුන් ලෙස විකිණිය හැක. ක්‍රියාවලිය අවසානයේ නිෂ්පාදනය ඒකක 850 කි. ක්‍රියාවලි ගිණුම සහ අසාමාන්‍ය හානි ගිණුම පිළියෙල කරන්න.

(ලකුණු 10)

(ආ) පහත දැක්වෙන ගණුදෙනු වලට අදාලව අසංකලිත ගිණුම් ක්‍රමය සහ සංකලිත ගිණුම් ක්‍රමය පදනම්ව අදාල ජ'නල් සටහන් පෙන්නුම් කරන්න.

| | | |
|---|---|---|
| i. | අමුද්‍රව්‍ය ගැනුම් | රු. 50,000/- |
| ii. | ණය හිමියන්ට ගෙවීම් | රු. 35,000/- |
| iii. | නිෂ්පාදනයට අන්තර්ග්‍රහණය කළ පොදු කාර්යය පිරිවැය | රු. 12,000/- |
| iv. | තොග හානිවීම් | රු. 4,000/- |
| v. | විකුණුම් | රු. 76,000/- |

ජ'නල් සටහන් පිළියෙල කිරීමේදී මතු දැක්වෙන ආකෘතිය භාවිතා කරන්න.

| ගණුදෙනුව | අසංකලිත ගිණුම් ක්‍රමය | සංකලිත ගිණුම් ක්‍රමය |
|---|---|---|
| (i) අමුද්‍රව්‍ය ගැණුම් | හර xxxxx | හර xxxx |
| | බැර xxxx | බැර xxxx |

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05.

(අ) විගණනය වියදම් සහිත ක්‍රියාවක් වුවද, සුදුසුකම්ලත් විගණකයෙකු ලවා තම ආයතනයේ ගණුදෙනු විගණනය කරවා ගැනීමෙන් ඕනෑම ආයතනයකට පොදුවේ අත්වන වාසි පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ආ) ඔබ ශ්‍රී ලංකා විගණන දෙපාර්තමේන්තුවේ විගණක නිලධාරියෙකු යැයිද, මානව සම්පත් අභිවර්ධන ආයතනයේ වාර්ෂික ගිණුම් පරීක්ෂා කිරීම සඳහා විගණකාධිපතිතුමා විසින් ඔබ පත් කර ඇතැයි ද සිතන්න.

ඔබට මෙම විගණනය ස්වාධීනව කරගෙන යා හැකිද යන්න විගණකගේ ස්වාධීනත්වය කෙරෙහි බලපාන කරුණු ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

(ඇ) අභ්‍යන්තර පාලනය, අභ්‍යන්තර පරීක්ෂාව සහ අභ්‍යන්තර විගණනය කෙටියෙන් පැහැදිලි කොට, මේවායේ ඇති සාර්ථකත්වය විගණනය සැලසුම් කිරීමේදී විගණකට කුමන අයුරින් වැදගත් වන්නේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

06.

(අ) ව්‍යාපාර කටයුතු පොදුවේ පරීක්ෂා කිරීම සඳහා යොදාගත හැකි අභ්‍යන්තර පාලන ප්‍රශ්නාවලියක ඇතුලත් විය යුතු කරුණු කවරේද?

(ලකුණු 10)

(ආ) ණයට ගැනුම් ගනුදෙනුවක නිරවද්‍යතාවය තහවුරු කරගැනීම සඳහා එය සංනිරීක්ෂණය කරන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

07.

(අ) ව්‍යාපාරයේ ශේෂපත්‍රයේ දක්වා ඇති කුමන හෝ වත්කමක් සත්‍යාපනය කිරීමේදී විගණක විසින් පොදුවේ සලකා බැලිය යුතු කරුණු කවරේද?

(ලකුණු 05)

(ආ) වෙළඳ ව්‍යාපාරයක ශේෂපත්‍රයෙහි දැක්වෙන මතු සඳහන් අයිතමයන් සත්‍යාපනය කරන ආකාරය පැහැදිලි කරන්න.

i. මෝටර් රථ

ii. මුදල් ශේෂය

iii. වෙළඳ ණය ණය හිමියෝ

(ලකුණු 09)

(ඇ) පහත දැක්වෙන දෑ පැහැදිලි කරන්න.

i. ස්ථාවර විගණන ලිපිගොනුව සහ ජංගම විගණන ලිපිගොනුව

ii. තත්වාගණනය නොකළ විගණන මතය සහ තත්වා ගණනය කල විගණන මතය

(ලකුණු 06)

(මුළු ලකුණු 20)

******************************************

IHRA
UNIVERSITY OF COLOMBO

# මානව සම්පත් අභිවර්ධන ආයතනය

# කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2017/2018

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2020 ජූලි)

## BLE 208 - මූල්‍ය කළමනාකරණය

අයදුම්කරුවන්ට උපදෙස් :

(1) ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතරකින් **(04)** සහ පිටු තුනකින් **(03)** සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

**01.**

(අ) අරමුදල් ප්‍රවාහ රූපසටහනක් ආශ්‍රයෙන් මූල්‍ය කළමනාකරණයේ විෂය පථය පැහැදිලි කරන්න.

(ලකුණු 09)

(ආ) මූල්‍ය කළමනාකරණයේ අරමුණු සහ කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08)

(ඇ) ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය අතර සමාන අසමානතා දක්වන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 25)

**02.**

(අ) ආයතනයක වත්කම් සහ වගකීම් ව්‍යුහයේ සංයුතිය (විවිධ වත්කම් හා වගකීම් වර්ග) පැහැදිලි කරන්න.

(ලකුණු 05)

(ආ) මෙහෙයුම් චක්‍රය (Operating Cycle) රූපසටහනක් ඇසුරින් විස්තර කරන්න.

(ලකුණු 10)

(ඇ) වෙළඳ සමාගමක මෙහෙයුම් චක්‍රයෙන් ආවරණය වන කාලය දින 365 කි. සැපයුම්කරුවන් විසින් මුදල් ගෙවීමට ලබාදෙන කාලය දින 15 කි.

සමාගමේ මූල්‍ය තොරතුරු වලින් කොටසක් රුපියල් මිලියන වලින් පහත දක්වා ඇත.

| | |
|---|---|
| සාමාන්‍ය ණයගැතියෝ | 473 |
| අමුද්‍රව්‍ය පරිභෝජනය | 4,380 |
| නිෂ්පාදන පිරිවැය | 9,855 |
| විකුණුම් පිරිවැය | 10,950 |
| වාර්ෂික විකුණුම් | 15,950 |
| සාමාන්‍ය අමුද්‍රව්‍ය තොග | 300 |

| | |
|---|---|
| ක්‍රියාවලි තොග | 324 |
| නිමිභාණ්ඩ තොග | 240 |

ඉහත තොරතුරු පදනම්කරගෙන වෙළඳ සමාගමේ මෙහෙයුම් චක්‍රකාලය සහ කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවය ගණනය කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 25)

**03.** සමාගමක ඇස්තමේන්තුගත මූල්‍ය තොරතුරු ඉදිරි මාස හයක කාලයක් සඳහා පහත වගුවේ දැක්වෙන පරිදි සාරාංශ කොට ඇත.

(රුපියල් මිලියන)

| මාසය | ගැණුම් | විකුණුම් | වැටුප | පොදුකාර්යය වියදම් |
|---|---|---|---|---|
| අගෝස්තු | 31,000 | 75,000 | 150 | 50 |
| සැප්තැම්බර් | 25,000 | 100,000 | 160 | 60 |
| ඔක්තෝබර් | 30,650 | 86,000 | 170 | 70 |
| නොවැම්බර් | 25,000 | 90,000 | 180 | 80 |
| දෙසැම්බර් | 36,000 | 102,500 | 190 | 90 |
| ජනවාරි | 37,000 | 110,000 | 200 | 100 |

අමතර තොරතුරු

1. අගෝස්තු 01 දිනට අපේක්ෂිත මුදල් ශේෂය රු.මි. 72,500 කි.
2. විකුණුම් වලින් 50% ක ප්‍රමාණයක් අත්පිට විකුණුම් වන අතර ණයට විකුණුම් සඳහා මුදල්, විකුණුම් සිදුවී මාසයකින් ලැබේ.
3. සැප්තැම්බර් මස අපේක්ෂිත ප්‍රාග්ධන පිරිවැය රු.මි. 8,000 කි.
4. දැනටමත් ඉල්ලුම් කර ඇති ණය මුදලක් සඳහා රු.මි. 10,000 මුදලක් සැප්තැම්බර් මස ලැබීමට නියමිත අතර එය ව්‍යාපාරය පුළුල් කිරීමට යොදාගැනීමට නියමිතය.
5. සෑම මාසයකම විකුණුම් වටිනාකමින් 5% ක්ට සමාන මුදලක් විකුණුම් කොටස් වශයෙන් ගෙවීමට එකඟ වී ඇත.